# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven

FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි

VOLUME 10
NUMBER 12

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

MARCH 10, 2008 මාර්තු මාසය (බුද්ධ වර්ෂ 2551 මැදින් මාසය)





ශ්‍රීලංකා යුද හමුදාවේ සෙබළ තරුණියක් උතුරේ යුද බිමේ සෝදිසියෙන් බලා සිටින අයුරුය මේ.
*A woman soldier of the Sri Lanka Army, keeping vigil under a shelter in the North of Sri Lanka*

බිරිඳක මවක ගුණ හිම් සියුමැලි නුඹට
කෙලෙසක හුරුවුණිද ගිනි අවියක් අතට?
කොටියා ඒ ද? නිදි නැත තුන්යම ඇසට
නැගණිය නුඹ මලකි! පිපි සිංහල බිමට

♦ *දයා ආනන්ද රණසිංහ*

Having caring nature of a wife, of a mother
How you could handle a gun, I always wonder.
With sleepless eyes gazed upon emerging terrorists,
You are a flower! of our Motherland that never wilts

♦ ***Daya Ananda Ranasinghe***

## 13 වන සංශෝධනය හෙවත්
# විනාසයකට පාර කැපීම

**සංජය විමලරත්න විසිනි**

**දැ**න් අප රටේ දේශපාලනඥයින් ජාතික ප්‍රශ්නය විසඳීමට පිළියමක් වශයෙන් නැවත වරක් රටේ ව්‍යවස්ථාව ඇදගෙන සුපුරුදු පරිදි එයට පැලැස්තර ඇලවීම අරඹා ඇත. 13 වෙනි සංශෝධනය යනු කුමක්ද? එහි අරමුණු හා ප්‍රතිවිපාක කුමක්වනු ඇතිද? ආදිය අද බොහෝ අය කරන විමසුම් වෙති. ඒ සඳහා අපේ ඉතිහාසයට දශක දෙකක පමණ ආපසු යැමක් කළ යුතු වෙයි.

1977 දී ජේ. ආර්. ජයවර්ධන මහතා 5/6 ක ඡන්ද ජයග්‍රහණයක් ලබා බලයට ඒමෙන් පසු එවකට පැවති ව්‍යවස්ථාව අහෝසි කර මින් අළුත් ව්‍යවස්ථාවක් සම්මත කරගත්තේය. පසුගිය වසර 30 තුළ අද දක්වාම රටේ පවතින ව්‍යවස්ථාව වන එය යටතේ විධායක ජනාධිපති ක්‍රමයත්, අනුපාතික ඡන්ද ක්‍රමයත්, මනාප අනුව දිස්ත්‍රික් මට්ටමේ ආසන සංඛ්‍යාවන්ට විවිධ දේශපාලන පක්ෂ අනුව මන්ත්‍රී පත්වීමත් ආදිය ප්‍රධාන වශයෙන් ක්‍රියාවට නැගීම ඇරඹිණ. වසර තිහකට පසු එහි විපාක අද අප ඇස් ඉදිරියේම පෙනෙන්නට තිබේ.

දේශපාලන මතවාද උඩ මහ ජාතිය සම සමව වාගේ බෙදෙන විට රජයක් සෑදීමට අනෙක් පක්ෂවල සහාය ලද යුතු ය. ජනගහන සංඛ්‍යාවෙන් අඩු වුව ද, ආගම්, ජාතිවාදී, වර්ගවාදී පදනම් මත ගොඩනැගුණු එවැනි පක්ෂවල සාපෙක්ෂ බලය වැඩිවේ. ඒ අය ආත්මාර්ථකාමී ලෙස කියන කියන අතට නැමෙමින් කටයුතු කරන්නට රජයට සිදුවෙයි. රජයේ හා විපක්ෂයේ අතර ආසන පරතරය අඩු නිසා මන්ත්‍රීන්ගේ දූෂණ ආදියට පවා රජයට නොදැක්කා ලෙස සිටීමට සිදුවෙයි. කිසිම කණ්ඩායමකට ස්ථාවර ආණ්ඩුවක් පිහිටුවා ජාතික යහපත සඳහා පාලනයක් ගෙනයා නොහැකි තත්වයක් පසුගිය කාලය පුරාමත්, අද දක්වාත් පවතින්නේ මේ නිසා ය.

### වර්ගවාදී අරගල සහ ඉන්දියාව අතපෙවීම

77 කාලය වන විටත් ද්‍රවිඩ වර්ගවාදී අරගල යම් ප්‍රමාණයකට වැඩෙමින් පැවතිණ. උතුරේ දී හමුදා සොල්දාදුවන් දහතුන් දෙනෙකු ඝාතනය කිරීම නිසා ඇතිවූ නොසන්සුන්තාව මත 1983 ජූලි මාසයේ සිංහළ දෙමළ කෝලාහලයක් ඇවිළිණ. මෙම පසුබිම තුළ කොළඹ නගරයේ ප්‍රධාන වශයෙනුත්, වෙන නගර කීපයකත්, ද්‍රවිඩයන් පීඩාවට පත්කිරීමත් සමග එල්.ටී.ටී.ඊ. කොටි සංවිධානය ත්‍රස්තවාදී පදනමක් මත එළියට ආවේ ය.

එවකට ඉන්දියාවේ බලයේ සිටි ඉන්දිරා ගාන්ධි රජය ද යම් ප්‍රමාණයකට කොටින්ට රුකුල් දුන් අතර, 1986 පමණ වන විට උතුරේ අරගල වැඩිවෙත්ම ඉන්දියාව අප රටට අත දැම්මේය. ඒ කාලය වන විට ඉන්දිරා ඝාතනය වීමෙන් පසු බලයට පැමිණ සිටි රජීව් ගාන්ධි යටතේ ඉන්දියා ආණ්ඩුවේ සහාය සෙවීමට ජේ. ආර්. රජයට සිදුවූ අතර කොටින් මැඩපැවැත්වීමට ඉන්දීය හමුදා පවා උතුරට ගෙන්වන ලදී.

### 13 වන සංශෝධනය

මෙවැනි තත්වයන් යටතේ වර්ගවාදී ප්‍රශ්නයට විසඳුම් යෙදීමට තදබල පෙලඹීමක් තිබිණ. යම් ප්‍රමාණයක ඉන්දියානු පෙඩරල් රාජ්‍ය ආකෘතිය අනුව යමින් බලය බෙදීම අරභයා 1987 දී එවකට පැවති ව්‍යවස්ථාවට 13 වෙනි වරට ද සංශෝධනයක් ගෙන එන ලදී. එම 13 වෙනි සංශෝධනයෙන් ව්‍යවස්ථාවේ 18 වෙනි වගන්තිය අන් කරුණු අතර පහත දැක්වෙන සේ වෙනස් කරන්නට යෝජනා විය.

**1**. ද්‍රවිඩ භාෂාවද රාජ්‍ය භාෂාව කිරීම
**2**. ඉංගිරිසි බස සිංහළ සහ දෙමළ භාෂා අතරේ පුරුක් භාෂාවක් ( link language) කිරීම.
**3**. රටේ පාලනය යම් ප්‍රමාණයකට විමධ්‍ය කිරීම සඳහා එවකට පැවති පළාත් නවය තුළ පළාත් සභා පිහිටුවීම.
**4**. නීතිමය සහ උසාවි ආදියේ වෙනස්වීම්. මේවාට අදාල ආයතන පිහිටුවීම. ඒවාට අයිති බලතල ආදී කරුණු රාශියක් සඳහා පිටු 22 කින් යුත් සංශෝධන මාලාවක් අඩංගු විය.

### විරෝධ මැද සම්මත කර ගැනීම

මෙම සංශෝධන යෝජනාවලට මහජාතිය තුළ ප්‍රධාන විරුද්ධ පක්ෂය වූ ශ්‍රීලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛව දේශ හිතෛෂීන්ගෙන් තදබල විරෝධය ප්‍රකාශවිණ. ඒ සඳහා උද්ඝෝෂණ කරමින් එවකට විරුද්ධ පක්ෂ නායිකාව වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඇතුළු නායක පිරිස්වලද සහභාගිත්වයෙන් පිටකොටුවේ බෝගහ හන්දියේ සත්‍යග්‍රහයක් පවත්වන ලදී. මෙය කඳුළුගෑස් ප්‍රහාර, වෙඩිතැබීම් ආදියෙන් පලවාහරින ලදී. දිගින් දිගටම පැවති වෙඩිතැබීම් නිසා 150 ක් පමණ දේශ හිතෛෂීහු මියගියහ. හදිසි නීතිය පැණවිණ. කෙසේ වුවද රජය තමන්ට තිබුණ විශාල වැඩි ඡන්ද බලය යොදාගනිමින් හදිසි නීතිය යටතේම එම සංශෝධනය පාර්ලිමේන්තුවේ සම්මත කරගත්තාය.


4 වන පිටුව බලන්න ⟶


**Lanka Viththi Website.**
**ලංකාවිත්ති වෙබ් අඩවිය**
**http://www. lankaheritage.com/lankaviththi/**




ලොවපුරා මුදල් යැවීම සඳහා
එකම විශ්වාසවන්ත නාමය

MCG FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3